# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,616 - 2009 අගෝස්තු මස 21 වැනි සිකුරාදා - 2009.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1438 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1442 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 අගෝස්තු මස 28 වැනි දින පළ කරන ගැසට් පත්‍රයේ දැන්වීම් 2009 අගෝස්තු මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

ලක්ෂමන් ගුණවර්ධන,
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.


1437 - B 080042— 6,500 (2009/08)
F1-

# පළාත් සභා නිවේදන

## දකුණු පළාතේ පළාත් සභාව

### 2007 අංක 01 දරන සභා ලේකම් කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් 2007 ඔක්තෝබර් මස 09 වැනි දින සම්මත කරන ලද 2007 ඔක්තෝබර් මස 17 වැනි දින ගරු ආණ්ඩුකාර තුමිය විසින් අනුමත කොට ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළු දෙනාගේ දැ ගැනීම පිණිස මෙසේ පළ කරමි.

එමෙන්ම අංක 1530/29 හා 2008 ජනවාරි මස 03 වැනි දින ගැසට් පත්‍රයේ පළ කරන ලද පළාත් සභා නිවේදන යටතේ ඇති 2007 අංක 01 දරන සභා ලේකම් කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය යන්න අවලංගු කරන ලද බව මෙයින් දන්වමි.

ශාන් විජයලාල් ද සිල්වා,
ප්‍රධාන අමාත්‍ය,
දකුණු පළාත් සභාව.

2009 ජූලි මස 22 වැනි දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
ඉහළ ඩික්සන් පාර,
ගාල්ල.

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාවේ 2007 අංක 01 දරන දකුණු පළාත් සභාවේ සභා ලේකම් කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

මෙම ප්‍රඥප්තිය දකුණු පළාතේ 2007 අංක 01 දරන දකුණු පළාත් සභාවේ සභා ලේකම් කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය යනුවෙන හඳුන්වනු ලැබේ.

මෙම ප්‍රඥප්තිය ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ දිනයේ සිට 1989 අංක 05 දරන දකුණු පළාත් සභාවේ දියුණු පළාත් සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය අහෝසි වන්නේ ය.

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.*

1. මෙම ප්‍රඥප්තිය දකුණු පළාතේ පළාත් සභාවේ 2007 අංක 01 දරන පළාත් සභා ලේකම් කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය.

*සභාවේ ලේකම්වරයා*

2.(i) ආණ්ඩුකාරවරයා විසින් පත්කරනු ලබන ලේකම්වරයෙකු වන අතර, ඔහු මෙහි අනු ඡේදයන්හි විධිවිධානවලට යටත්ව යථා පැවැත්මෙන් සිටින තාක් කල් ස්වකීය ධුරය දරන්නේ ය.

(ii) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක් හොබවන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ පන්තියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු සභාපතිවරයාගේ එකඟතාවය මත ලේකම්ධුරය සඳහා ඉහත (i) අනුඡේදය යටතේ පත්කළ හැකිය.

(iii) ලේකම්වරයාට ගෙවනු ලබන වැටුප්, දීමනා හා වරප්‍රසාද පළාත් අමාත්‍යාංශ ලේකම්වරයෙකු හට ගෙවනු ලබන වැටුප්, දීමනා හා වරප්‍රසාදවලට සමාන විය යුතු අතර, එය පළාත් සභා අරමුදලට වැය බරක් විය යුතු ය.

(iv) ලේකම් ධුරය විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වන අතර,

(v) ලේකම්වරයා-

(අ) මියායාමෙන්, හෝ
(ආ) ආණ්ඩුකාරවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් ඉල්ලා අස්වීමෙන්, හෝ
(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වෙනත් තනතුරකට ස්ථාන මාරුවීමෙන්, හෝ
(ඈ) වයස අවුරුදු පනස්පහ සම්පූර්ණ වීමේදී හෝ ඊට පසු ඕනෑම අවස්ථාවකදී ආණ්ඩුකාරවරයාට දැනුම්දීමකට යටත්ව විශ්‍රාම ගැනීමේ මනාපය පළ කිරීමෙන්, හෝ
(ඉ) රෝගාතුරවීම නිසා හෝ ශාරීරික හෝ මානසික දුර්වලතාවයක් නිසා හෝ යම් විනය නියෝගයක් මත හෝ ආණ්ඩුකාරවරයා විසින් ධුරයෙන් ඉවත් කිරීම නිසා හෝ වෙනත් අඩපණවීමක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර වීම නිසා, හෝ

(ඊ) යම් අධිකරණයක් මගින් දෙනු ලැබූ තීන්දුවක් මගින් රුපියල් 1000 කට නොඅඩු දඩයක් නිසා හෝ සිර දඬුවමක් නිසා හෝ ලේකම් ධුරය හිස් වන්නේය. මෙයින් පරිබාහිරව වෙනත් කරුණක් මත ලේකම්ධුරය හිස් නොවන්නේ ය.

(උ) රෝගාතුරවීම නිසා හෝ වෙනත් දුබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරවීම හෝ හේතු කොටගෙන ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට ලේකම්වරයාට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක (i) වැනි උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා ආණ්ඩුකාරවරයා විසින් වෙනත් තැනැත්තෙකු පත් කරනු ලැබිය හැකිය.

**ලේකම් කාර්යාලය හා ලේකම් කාර්ය මණ්ඩලය.**

3. (1) සභාවට ලේකම් කාර්යාලයෙක් තිබිය යුතු අතර, (මෙහි මින්මතු "ලේකම් කාර්ය මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) ලේකම් කාර්ය මණ්ඩලය, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ඇතිව, ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(2) ලේකම් කාර්ය මණ්ඩලයේ නිලධරයන් සංඛ්‍යාව, කාර්ය මණ්ඩල උපදේශක කමිටුවේ නිර්දේශය මත ආණ්ඩුකාර වරයාගේ අනුමැතිය ඇතිව වෙනස් කරනු ලැබිය හැකිය.

(3) ලේකම් කාර්ය මණ්ඩලයට නිලධරයන් පත් කිරීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලේකම්වරයා විසින් කරනු ලබන ඉල්ලීමක් මත ඒ කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුතු ය.

(4) 1989 අංක 5 දරන ව්‍යවස්ථාව යටතේ ලේකම් කාර්ය මණ්ඩලයට පත් කරන ලද නිලධාරයන් මේ ව්‍යවස්ථාව ආරම්භ වන දින පටන් පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබිය යුතු අතර,

(අ) ලේකම් කාර්යාලයට කරනු ලැබූ ඔවුන්ගේ පත්වීම් දින, සියලු කාර්ය සඳහා පළාත් රාජ්‍ය සේවයට කරනු ලැබූ පත්වීම් දින ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) ලේකම් කාර්යාලයේ ඔවුන්ගේ සේවා කාලය, පළාත් රාජ්‍ය සේවයේ සේවා කාලය මෙන් සළකනු ලැබිය යුතු ය.

(ඇ) පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම හේතු කොටගෙන, එය ලේකම් කාර්යාලයේ ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාවය කෙරෙහි හානිකර ලෙස බල නොපෑ යුතු ය.

(ඈ) පළාත් රාජ්‍ය සේවයේ සමාන හෝ එම තනතුරම දරන සාමාජිකයෙකුගේ ජ්‍යෙෂ්ඨතාවයට, ඒ අන්තර්ග්‍රහණය කිරීම හානිකර ලෙස බල නොපෑ යුතු ය.

**වෙනත් පත්වීම්.**

4. ලේකම්වරයා විසින්, ආණ්ඩුකාරවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව, සේවයේ හදිසි අවශ්‍යතා අනුව අනියම් හෝ දෛනික පදනම මත, නැතහොත් කොන්ත්‍රාත් පදනම මත උචිත පරිදි සුදුසුකම් ලත් තැනැත්තන්ගෙන් ලේකම් කාර්ය මණ්ඩලයට තාවකාලික පත්වීම් කරනු ලැබිය හැකිය.

**මාරුවීම්.**

5. (අ) පළාත් රාජ්‍ය සේවයේ යම් තනතුරක් දරන යම් තැනැත්තෙකු ලේකම් කාර්ය මණ්ඩලයට මාරු කිරීම, ඒ කාර්යය සඳහා ලේකම්වරයාගේ කැමැත්ත ප්‍රථමයෙන් ලබාගෙන කරනු ලැබිය හැකිය.

(ආ) ලේකම්වරයා විසින් කරන ලද ඉල්ලීමක් මත ලේකම් කාර්ය මණ්ඩලයට පත් කරන ලද්දාවූ හෝ මාරු කරන ලද්දා වූ යම් තැනැත්තකු ලේකම්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව, ලේකම් කාර්යා මණ්ඩලයෙන් මාරු කරනු නොලැබිය යුතු ය.

එසේ වුවද එවැනි යම් නිලධරයෙකු සේවා නියුක්තිය සඳහා මුදා හැරීම, පහත දැක්වෙන හේතූන් නිසා හැර, ලේකම්වරයා විසින් සාමාන්‍යයෙන් ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය, එනම්-

(අ) ලේකම් කාර්ය මණ්ඩලයේ ඔහුගේ සේවය බැඳුම් කරයකට යටත් වූ අවස්ථාවක, හෝ

(ආ) ඔහුගේ සේවය බැඳුම්කරයකට යටත් නොවුව ද, ලේකම් කාර්යාලයේ සේවය කිරීම සඳහා ලේකම් කාර්යාලය විසින් ඔහු විශේෂයෙන් පුහුණු කරනු ලැබ ඇත්නම්, හෝ

(ඇ) එවැනි යම් නිලධරයෙකු මුදා හැරීම, ලේකම් කාර්යාලයේ කාර්ය කිරීමෙහි ලා අහිතකර ලෙස බලපෑ හැකි යැයි ලේකම්වරයා සලකන අවස්ථාවක.

**ධුරය අත්හැරීම.**

6. ලේකම් කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුරය පහත සඳහන් හේතූන් නිසා හිස්විය යුතුය, එනම්-

(අ) විශ්‍රාම යාම
(ආ) මාරු කිරීම
(ඇ) ඉල්ලා අස්වීම
(ඈ) ඉවත් කිරීම, හෝ
(ඉ) මරණය

කාර්ය මණ්ඩලයේ වැටුප් සහ දීමනා.

7. (1) ලේකම් කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු වැටුප් සහ වෙනත් දීමනා සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(2) 5 වැනි වගන්තියේ (අ) ඡේදය යටතේ කාර්ය මණ්ඩලයට මාරු කරන ලද්දාවූ හෝ 3 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය යටතේ පත් කරන ලද්දාවූ නිලධරයන්ට ඔවුන් ලේකම් කාර්යාලයේ සේවයේ සිටින තාක් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ඇතිව, වැටුපට අතිරේකව දීමනාවක් ගෙවනු ලැබිය හැකිය.

අලුත් තනතුරු ඇති කිරීම.

8. 9 වැනි වගන්තියේ සඳහන් කාර්ය මණ්ඩල උපදේශක සභාවේ නිර්දේශය මත, අලුත් නිලධරයන් පත් කිරීමට හැකිවන පරිදි සභාවේ වඩා හොඳ පරිපාලනයක් සඳහා අවශ්‍ය වන අලුත් තනතුරු හඳුනා ගැනීම, ලේකම්වරයා විසින් කරනු ලැබිය යුතු ය.

කාර්ය මණ්ඩල උපදේශක සභාව.

9. (1) (මෙහි මින් මතු "උපදේශක කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩල උපදේශක කමිටුවක් තිබිය යුතු ය.

(අ) සභාවේ සභාපති
(ආ) සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා
(ඇ) සභාවේ විරුද්ධ පක්ෂයේ නායක
(ඈ) ප්‍රධාන ලේකම්
(ඉ) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් සහ
(ඊ) සභාවේ ලේකම්

(2) සභාවේ සභාපති හා ලේකම් පිළිවෙලින් උපදේශක කමිටුවේ සභාපති හා ලේකම් විය යුතු ය.

කාර්ය මණ්ඩල උපදේශක කමිටුවේ කර්තව්‍ය.

10. කාර්ය මණ්ඩල උපදේශක කමිටුව විසින් පහත දැක්වෙන කාර්තව්‍ය ඉටු කරනු ලැබිය යුතු ය. එනම්,

(අ) 8 වැනි වගන්තියෙන් සඳහන් පරිදි අලුත් තනතුරු හඳුනා ගැනීම,

(ආ) ලේකම් කාර්ය මණ්ඩලය සඳහා සැපයිය යුතු පහසුකම් හා වරප්‍රසාද නිශ්චය කිරීම,

(ඇ) ලේකම් කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව හා ඒ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා නිශ්චය කිරීමේදී ආණ්ඩුකාරවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම.

නියෝග.

11. ආණ්ඩුකාරවරයා හෝ පළාත් රාජ්‍ය කොමිෂන් සභාව විසින් දැනටමත් පනවනු ලැබ ඇත්තාවූ හෝ කලින් කළ පනවනු ලැබිය හැකිවූ රීති හා නියෝග ලේකම් කාර්ය මණ්ඩලයට අදාල විය යුතු ය.

කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් රජයේ සේවකයන් වශයෙන් සැළකිය යුතු බව.

12. ලේකම් කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් දණ්ඩ නීති සංග්‍රහයේ සහ අල්ලස් පනතේ අර්ථානුකූලව හා එහි කාර් සඳහා රජයේ සේවකයන් වශයෙන් සැළකිය යුතු ය.

කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් විශ්‍රාම යාම.

13. (1) ලේකම් කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට, වයස අවුරුදු පනස් හත (57) එළඹීමේ දී හෝ ඊට පෙර යටත් පිරිසෙයින් තම විශ්‍රාම යාමේ දිනට මාස තුනකටවත් පෙර ලේකම් වෙත ඉදිරිපත් කෙරෙන ලිපියක් මඟින් විශ්‍රාම යාමේ මනාපය ඇත්තේ ය.

(2) වයස අවුරුදු පනස් හත (57) ඉක්මවා සේවය කිරීමට කැමැත්තක් දක්වන යම් නිලධාරියෙකු විසින් තමා අවුරුදු පනස්හතට එළඹෙන දිනට මාස තුනකට කලින් සහ ඉන් පසුව තමාට දෙන ලද එක් එක් සේවා දිගුකිරීමේ කාල පරිච්ඡේද ඉකුත්වීමට මාස තුනකට පෙර ආණ්ඩුකාරවරයා වෙත ලිඛිත ඉල්ලීමක් කරනු ලැබිය යුතු අතර, ආණ්ඩුකාරවරයා විසින් ලේකම්ගේ නිර්දේශය මත ඒ සේවා දිගුකිරීම, දෙනු ලැබිය හැකිය. වයස අවුරුදු 60 ඉක්මවා කිසිම සේවා දිගු කිරීමක් දෙනු නොලැබේ.

මුදල්.

14. ආණ්ඩුකාරවරයා විසින් සාදන ලදුව, සභාව විසින් සම්මත කරන ලද සභා අරමුදල් වලට අදාළ රීතිවලට අනුකූලව එක් එක් වර්ෂය සඳහා සභාවේ වියදමට අදාල වූ ඇස්තමේන්තුවක් ලේකම් විසින් පිළියෙල කර, සභාවේ ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපනය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙ ව්‍යවස්ථාවෙහි-

"ආණ්ඩුකාරවරයා" යන්නෙන්, දකුණු පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ.

"සභාව" යන්නෙන් දකුණු පළාතේ පළාත් සභාව අදහස් වේ.

"පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව" යන්නෙන් දකුණු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අදහස් වේ.

"ලේකම්" යන්නෙන් දකුණු පළාතේ පළාත් සභා ලේකම් අදහස් වේ.

"ලේකම් කාර්යාලය" යන්නෙන් දකුණු පළාතේ, පළාත් සභා ලේකම් කාර්යාලය අදහස් වේ.

මේ ව්‍යවස්ථාවේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය. අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨ බල පැවැත්විය යුතු බව.

08-426

---

### බලය පැවරීමේ නියෝගය

### 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත සහ 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත සමග කියවෙන 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව උතුරු මැද පළාතේ සමුපකාර, වෙළඳ හා ආහාර, ජේෂකර්මාන්ත, ග්‍රාම සංවර්ධන, කර්මාන්ත හා නිවාස පිළිබඳ ඇමති හේරත් බංඩා සේමසිංහ වන මම, 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත සහ 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත සමඟ කියවෙන 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 2(2) වගන්තියේ බලතල අනුව උතුරු මැද පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්වරයාට සහාය වීමට පත්කර ඇත්තා වූ පහත සඳහන් උපලේඛනයේ i වැනි තීරුවෙහි සඳහන් අය වෙත 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත සහ 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත සමඟ කියවෙන 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත සහ ඒ යටතේ පනවා ඇති රීති මාලාව යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්වරයාට පැවරී ඇත්තාවූ පහත සඳහන් උපලේඛනයෙහි iii වැනි තීරුවෙහි සඳහන් සියලුම බලතල i වැනි තීරුවෙහි සඳහන් අය වෙත උපලේඛනයෙහි ii තීරුවේ සඳහන් දින සිට මෙයින් පවරමි.

හේරත් බංඩා සේමසිංහ,
සමුපකාර, වෙළඳ හා ආහාර, ජේෂකර්මාන්ත,
ග්‍රාම සංවර්ධන, කර්මාන්ත හා නිවාස
අමාත්‍යාංශය,
උතුරු මැද පළාත.

2009 ජුනි මස 10 වැනි දින,
අනුරාධපුර.

#### උපලේඛනය

| | *i වැනි තීරුව* | *ii වැනි තීරුව* | *iii වැනි තීරුව* |
|---|---|---|---|
| 01. | පත්නල හේතේ ගෙදර කරුණාරත්න | 2008.08.30 | 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 03, 04, 05, 06, 07, 08, 33, 44, 44(6) හැර 45, 52, 53, 54, 55, 56, 57, 58, 58(3) සහ 58(5) හැර 59 (59(1) (ආ) හැර), 60 (1), 60(2), 68, 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 61 වැනි වගන්තිය යටතේ රීති මාලාවේ 04, 11, 16(11), 18, 19, 20, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49 (49 xii හැර) 51, 52 සහ 53 දරන රීති යටතේ රෙජිස්ට්‍රාර්ගේ සියලුම බලතල. |
| 02. | රත්නායක මුදියන්සේලාගේ සීලවතී කුමාරිහාමි | 2009.05.26 | |

08-368